
## වෙළෙඳපොළ තරගකාරීත්වය ඉහළ නැංවීම

තරගයේ පියවරක් ඉදිරියෙන් සිටින්න!

ඔබගේ ව්‍යාපාරික මෙහෙයුම් කටයුතුවලදී තිරසාරත්වයට මුල්තැන දීමෙන් ඔබට වෙළෙඳපොළ ප්‍රවණතාවලට අනුකූල වීමටත්, තරගකාරී වාසියක් අත්කර ගැනීමටත් හැකි වේ. ඔබගේ ව්‍යාපෘති සඳහා තිරසාරත්ව සහතිකයක් ලබා ගැනීමෙන් ඔබගේ වෙළෙඳපොළ ආස්ථානය ශක්තිමත් කිරීමටත්, නව අවස්ථා ඇතිකර ගැනීමටත් හැකි වේ. තිරසාරත්වය වෙනුවෙන් ගන්නා කුඩා පියවර වුව ද පැහැදිලි බලපෑමක් ඇති කරයි.

උදාහරණ: ඔබගේ ව්‍යාපාරය සඳහා තිරසර පිරික්සුම් ලැයිස්තුවක් සකස් කරන්න. නැතිනම්, ලෝක ගමන් සහ සංචාරක කවුන්සිලය ගොඩනගා ඇති හෝටල් තිරසාරත්ව මූලිකාංග වැනි ජාත්‍යන්තරව පිළිගත් පිරික්සුම් ලැයිස්තුවක් යොදා ගන්න.



## මෙහෙයුම් පිරිවැය අඩු කිරීම

කුඩා වෙනස්කම්, දැවැන්ත ප්‍රතිඵලවලට මග පාදයි!

තිරසරවීම යනු කාර්යක්ෂමතාව සහ පරිභෝජනය පිළිබඳ අවධානය යොමු කිරීම ද වේ. එය මෙහෙයුම් පිරිවැය අඩු වීම වැනි දිගුකාලීන ප්‍රතිලාභවලට මග පාදයි. සූර්ය කෝෂ සහ ජල පිරිපහදු පද්ධති සඳහා ආරම්භයේදී වැඩි පිරිවැයක් දැරීමට සිදු වුවත්, කාලයත් සමග එමගින් කැපීපෙනෙන ප්‍රතිලාභ හිමිකර ගත හැකිය. තිරසාරත්වය සඳහා යන ගමනට පිවිසීම සඳහා ඔබගේ බලශක්ති, ජලය කසළ පරිභෝජනය පිළිබඳ ඇගයීමක් සිදු කරන්න. පළමු පියවර ලෙස ඔබගේ භාවිතය අධීක්ෂණය කරන්න. ප්ලාස්ටික් භාවිතය සහ දිරාපත් නොවන ද්‍රව්‍යවලින් ඇසුරුම් කිරීම අවම කිරීම මගින් කසළ උත්පාදනය, හැසුරුම් කාලය සහ බැහැර කිරීමේ පිරිවැය අඩුකර ගත හැකිය.

උදාහරණ: තුවා සහ ලිනන් යළි භාවිත කිරීමේ වැඩසටහනක් දියත් කිරීම මගින් විදුලි සහ ජල පිරිවැය මෙන්ම පුද්ගලික කාලය ද කැපීපෙනෙන ලෙස අඩුකර ගත හැකිය



තිරසාරත්වය අනුගමනය කරන ව්‍යාපාර ස්වභාවධර්මය ආරක්ෂා කිරීමට උත්සාහ කරන අතර ස්වභාවික සම්පත් සංරක්ෂණය කිරීමට සවිඥානක උත්සාහයන් දරයි. මෙය ගනුදෙනුකරුවන්ගේ සහ අනෙකුත් පාර්ශවකරුවන්ගේ ඇස් හමුවේ ව්‍යාපාරයේ ප්‍රතිරූපය වැඩි දියුණු කරනවා පමණක් නොව සෑම කෙනෙකුටම සම්පත් ලබා ගැනීමේ හැකියාවද වැඩි දියුණු කරයි.

## තිරසාර සංචාරක ව්‍යාපාරය යනු කුමක්ද?

තිරසාර සංචාරක ව්‍යාපාරය යනු එහි වර්තමාන සහ අනාගත ආර්ථික, සමාජීය සහ පාරිසරික බලපෑම් පිළිබඳව පූර්ණ වශයෙන් සැලකිල්ලට ගන්නා සංචාරක ව්‍යාපාරය, අමුත්තන්ගේ, කර්මාන්තයේ, පරිසරයේ සහ සත්කාරක ප්‍රජාවන්ගේ අවශ්‍යතා සපුරාලීමයි.

**ඔබ නොවේ නම්, කවුද? අදම 👉 ක්‍රියා කරන්න 🌳 තිරසාර ලෙස සිතන්න 🌏**


USAID Indo-Pacific Opportunity Project (IPOP)
International Development Group LLC

56/6A Horton Place
Colombo 7, Sri Lanka
Tel: 94-112697052


USAID FROM THE AMERICAN PEOPLE

# තිරසාරත්වයේ වැදගත්කම



Booking.com හි 2022 තිරසර සංචාරක වාර්තාවට අනුව සංචාරකයින් 46% ක් අවම වශයෙන් වසරකට එක් වරක් හෝ තිරසර නවාතැන් තෝරාගෙන තිබේ.

Expedia සමූහය විසින් 2022 දී සිදුකරන ලද තිරසර සංචාරක අධ්‍යයනය මගින් පෙන්වා දෙන්නේ සංචාරවලදී පාරිභෝගිකයින්ගෙන් 90% ක් තිරසර විකල්ප වෙත යොමුවන බවය.



## මෙම සංඛ්‍යා ඔබගෙ ව්‍යාපාරයට වැදගත් වන්නේ කෙසේද?

- තිරසර සංචාරක තෝරාගැනීම්, නවාතැන් සහ සේවා සඳහා ඇති ගෝලීය ඉල්ලුම ස්ථාවර ලෙස ඉහළ යමින් පවතී.
- සංචාරකයින් තම පාරිසරික බලපෑම පිළිබඳ විශේෂ අවධානයක් යොමුකරන අතර ඔවුහු එම බලපෑම අවමකර ගත හැකි ආකාර පිළිබඳ සක්‍රීයව සොයා බලති.
- සංචාරක කර්මාන්තය තුළ පාරිභෝගික තීරණවලට ප්‍රධාන වශයෙන් බලපාන සාධකයක් බවට තිරසාරත්වය පත්ව තිබේ.

තිරසාරත්වයට අනුගත වීම තවදුරටත් විකල්පයක් නොව; අවශ්‍යතාවකි. තිරසාරත්වය, සංචාරක කර්මාන්තය තුළ ඔබගේ ව්‍යාපාරයේ තරගකාරී වාසිය බවට පත්කර ගන්න!

USAID
FROM THE AMERICAN PEOPLE

# තිරසාරත්වයේ වැදගත්කම

## අවදානම් කළමනාකරණය ඉහළ නැංවීම

සංචාරක කර්මාන්තයේ ව්‍යාපාරවලට විවිධ අවදානම්වලට මුහුණ දීමට සිදු වේ. දේශගුණික විපර්යාස හේතුවෙන් ස්වභාවික සංචාරක නිෂ්පාදන, ආහාර සැපයුම් දාම සහ ජලය වැනි අත්‍යවශ්‍ය සම්පත්වලට බලපෑමක් ඇති වේ. තිරසර ක්‍රමවේද අනුගමනය කිරීම මගින් මෙම අවදානම් අවමකර ගැනීමට මෙන්ම අමුත්තන් හට අසමසම අත්දැකීම් ලබාදීම සඳහා අවස්ථා විවරකර ගැනීමට ද හැකි වේ.

උදාහරණ: ආනයනික භාණ්ඩ වෙනුවට හැකි පමණ දේශීයව වැවෙන/නිෂ්පාදනය කෙරෙන භාණ්ඩ භාවිත කරන්න. ජාතික/බහුජාතික සමාගම් වෙනුවට සේවා ලබා ගැනීම සඳහා ප්‍රාදේශීය සමාගම් යොදා ගන්න. මෙමගින් ඔබගේ සැපයුම් දාමයට ඇතිවන බාහිර බලපෑම්වල අවදානම අවමකර ගැනීමටත්, එමගින් ඔබගේ ව්‍යාපාරයේ නම්‍යශීලි බව පවත්වා ගැනීමටත් හැකි වේ.



## පාරිභෝගික තෘප්තිය සහ ධනාත්මක ප්‍රචාරය

තෘප්තිමත් පාරිභෝගිකයෝ යළි-යළිත් ආදායම් ගෙනෙති

තිරසර සංචාරක කර්මාන්තය අඛණ්ඩව වර්ධනය වෙමින් නුදුරේදී ම එය සංචාරක කර්මාන්තයේ මිනුම් ලකුණක්වනු ඇත. තිරසාරත්වය පිළිබඳ අවධානය යොමුකරන මෙහෙයුම්කරුවන්/ව්‍යාපාර වෙත යොමු වීමට මිනිසුන් තුළ වැඩි නැඹුරුවක් ඇති බවත්, තිරසර ව්‍යාපාරික ක්‍රමවේද අනුගමනය කරන මෙහෙයුම්කරුවන් වෙනුවෙන් වැඩි මුදලක් වැය කිරීමට ඔවුන් සූදානම් බවත් පර්යේෂණ මගින් පෙන්වා දී ඇත. තමන් සිදුකරන තෝරාගැනීම් පිළිබඳ යහපත් හැඟීමක් ඇතිකර ගැනීමට සංචාරකයින්ට අවශ්‍යවන අතර, තමන් නිවාඩුවක් සඳහා වැයකරන මුදලින් ග්‍රාමීය ප්‍රජාවට යහපතක් වන්නේද යන්න පිළිබඳ දැනගැනීමට ද ඔවුන්ට අවශ්‍ය වේ. සංචාරක වෙබ් අඩවිවල ධනාත්මක ප්‍රතිචාර ද ඔබගේ ව්‍යාපාරයේ උන්නතියට හේතු වේ.

උදාහරණයක් ලෙස, දේශීය ආහාර සහ සම්ප්‍රදායික දෑ සඳහා අමුත්තන්ගේ වැඩි නැඹුරුවක් පවතින විට, එවැනි දෑ ඔවුන්ට ලබා දෙන්නේ නම් වැඩි සංචාරකයින් පිරිසක් ආකර්ෂණයකර ගැනීමට ඔබට හැකි වේ.



## කාර්යමණ්ඩල සාමාජිකයින් ආකර්ෂණයකර ගැනීම සහ රඳවා තබා ගැනීම

යහපත් කම්කරු ප්‍රතිපත්ති, ආකර්ෂණීය සහ තිරසර සේවක ප්‍රතිලාභ සහ ධනාත්මක රැකියා පරිසරයක් ඇති සමාගමකට දක්ෂ කාර්යමණ්ඩල සාමාජිකයින් ආකර්ෂණයකර ගැනීමටත්, ඔවුන් රඳවා තබා ගැනීමටත් හැකි වේ. එමගින් ව්‍යාපාරික මෙහෙයුම් කටයුතුවල ඵලදායීතාව ඉහළ නැංවීමටත්, සේවකයින් බඳවා ගැනීම සඳහා ගතවන කාලය සහ මුදල් ඉතිරිකර ගැනීමටත්, සේවක ගැටලු සමථයකට පත්කර ගැනීමටත් හැකි වේ. එවිට ව්‍යාපාරය වඩාත් ලාභදායී වේ.

උදාහරණ: වැටුප් සහිත නිවාඩු ලබාදීම සහ අතිකාල සඳහා ගෙවීමක් සිදු කිරීම මගින් රැකියාව සහ පුද්ගලික ජීවිතය අතර තෘප්තිමත් සමබරතාවක් පවත්වා ගැනීමට හැකිවන අතර එමගින් වඩාත් සාර්ථක ඵලදායීතාවක් ඇතිකර ගත හැකිය.



## අභ්‍යන්තර සහ බාහිර නවෝත්පාදනය බලගැන්වීම

කාර්යක්ෂම සහ නිර්මාණශීලී අත්දැකීම් අමුත්තන්ට ලබා දීමට හැකි වන්නේ සේවකයින් සහ කළමනාකරණය තිරසාරත්වයට හුරු වීමෙනි. ව්‍යාපාරයේ මෙහෙයුම් පැතිකඩ විශ්ලේෂණය කිරීමෙන් නවෝත්පාදනය සහ අසමසම සංචාරක අත්දැකීම් ගොඩනැගීම සිදුකර ගත හැකි අතර එමගින් අවසානයේදී ව්‍යාපාරය වර්ධනයකර ගත හැකිය. ප්‍රදේශයේ ප්‍රජාව සහ පාර්ශ්වකරුවන් අතර සබඳතා ගොඩනගා ගැනීමෙන් සමාජයීය සහ සංස්කෘතික ප්‍රාග්ධනය වැඩිදියුණුකර ගත හැකි අතර, සංචාරක නිෂ්පාදන සහ සේවා පුළුල්කරන නවෝත්පාදන විසඳුම් ලබා දීමට එය රුකුලක් වේ. උදාහරණයක් ලෙස, ප්‍රදේශයේ හස්ත කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා දීමෙන් සහ අනතුරුව ඒවා මිලදී ගැනීමෙන් හෝ ඔවුන්ගේ ම ස්ථානයක එය සිදුකර ගැනීමට පහසුකම් සැලසීමෙන් ව්‍යාපාරවලට ප්‍රජා කටයුතු සඳහා සහයෝගය ලබා දිය හැකිය.

උදාහරණ: දොඩම් සහ ලෙමන් ලෙලි ආදී මුළුතැන්ගේ ඉතිරිවන ද්‍රව්‍යවලින් ජෑම් හෝ කල්තබා ගත හැකි ආහාර හෝ නිෂ්පාදනය කිරීමට කාර්යමණ්ඩලයට හැකිය.



## මූල්‍යයනය සඳහා ප්‍රවේශය

තිරසර ආකෘතියකට අනුව ක්‍රියාත්මකවන ව්‍යවසාය සඳහා සිය තිරසර න්‍යායපත්‍රය තවදුරටත් පුළුල්කර ගැනීමට අරමුදල් සපයා ගැනීමේ අවස්ථා හිමි වේ.

දේශගුණික විපර්යාස හේතුවෙන් වර්ධනය වෙමින් පවතින අවදානම් හේතුවෙන් සම්පත් හීන වීම සහ ව්‍යාපාරික අගනාකම්වල අපේක්ෂා වෙනස්වීම් මත තිරසර ව්‍යාපාරික ආකෘති වෙතට නිරායාසයෙන් නැඹුරු වීමට සිදු වේ. එබැවින්, තිරසර මෙහෙයුම් කටයුතු සඳහා සිදුකරන ආයෝජනවල පැහැදිලි වර්ධනයක් ඇතිවනු ඇත.

උදාහරණ: නවෝත්පාදන ක්‍රමවලට අනුව අන්තර්කරණය සහ තිරසාරත්වය අනුගමනය කරන ව්‍යාපාර සඳහා පරිත්‍යාග මත පදනම් වූ ව්‍යාපෘති මගින් නිරන්තරයෙන් අරමුදල් ලබා දෙයි.



## තිරසාරත්වය, ස්ථාවරත්වයට මගපාදයි

තිරසාරත්වය අනුගමනය කිරීම යනු හුදෙක් මිනිසුන් සහ මිහිතලය සමග ගනුදෙනු කිරීමට සීමා වූවක් නොවේ. එමගින් ඔබගේ ව්‍යාපාරයේ නම්‍යශීලීබව සහ අඛණ්ඩතාව ද මැනවින් නිරූපණය වේ. ඔබේ ව්‍යාපාරය පදනම්වන මිනිසුන් සහ සම්පත් පවත්වා ගැනීම ව්‍යාපාරයේ මූල්‍යමය ස්ථාවරත්වයට දායකත්වය ලබා දෙයි.

උදාහරණයක් ලෙස, ඔබගේ නිෂ්පාදන සහ සේවා විවිධාංගීකරණය කිරීම සහ අගය එකතු කිරීම මගින් ඔබගේ ව්‍යාපාරය පිරිනමන භාණ්ඩ හා සේවා පුළුල්කර ගත හැකිය. එසේම, ආනයනික භාණ්ඩ වෙනුවට දේශීයව සපයා ගන්නා භාණ්ඩ භාවිත කිරීම මගින් පිරිවැය අඩුකර ගත හැකිය.

උදාහරණ: ගෘහ භාණ්ඩ, පොරොදු, ආහාර ලැයිස්තු සහ පාන වර්ග දේශීයව සපයා ගන්නා අමුද්‍රව්‍යවලින් සකස් කිරීමෙන් දේශීය සංස්කෘතියේ අසමසම පැතිකඩ ප්‍රවර්ධනය කරන්න.

